# පාරිසරික මාධ්‍යවේදය

## පිළිබඳ මාර්ගෝපදේශ ග්‍රන්ථය



USAID
FROM THE AMERICAN PEOPLE

ශ්‍රී ලංකා පුවත්පත් ආයතනය
இலங்கை பத்திரிகை ஸ்தாபனம்
Sri Lanka Press Institute

# පාරිසරික මාධ්‍යවේදය පිළිබඳ මාර්ගෝපදේශ ග්‍රන්ථය

**ශ්‍රී ලංකා පුවත්පත් ආයතනය (SLPI)**
2023 - මැයි

ශ්‍රී ලංකා පුවත්පත් ආයතනය, ශ්‍රී ලංකාවේ මාධ්‍ය සංවර්ධනය සහ ආචාර ධර්ම සඳහා කැප වූ ප්‍රමුඛතම ආයතනයකි. එය මාධ්‍යවේදීන් පුහුණු කරමින්, ශ්‍රී ලංකා ජනමාධ්‍ය විද්‍යාලය හරහා තරුණ මාධ්‍යවේදීන්ට උර දෙමින්, ශ්‍රී ලංකා පුවත්පත් පැමිණිලි කොමිසම හරහා මාධ්‍ය කර්මාන්තය තුළ ස්වයං-නියාමනය ප්‍රවර්ධනය  කරමින් නිදහස්, ස්වාධීන සහ වගකිවයුතු පුවත්පත් කලාවක් වෙනුවෙන් පෙනී සිටියි. ශ්‍රී ලංකා පුවත්පත් ආයතනය මාධ්‍ය නිදහස සහ පුවත්පත් කලාවේ වෘත්තීයභාවය ප්‍රවර්ධනය කිරීමට සහ රට තුළ ප්‍රජාතන්ත්‍රවාදය පෝෂණය කිරීමට කැපවී සිටී.

© 2023 ශ්‍රී ලංකා පුවත්පත් ආයතනය. සියලු හිමිකම් ඇවිරිණි.

**Disclaimer**

This handbook is made possible by the support of the American People through the United States Agency for International Development (USAID). The contents of this handbook are the sole responsibility of the contractor and do not necessarily reflect the views of USAID or the United States Government.

පාරිසරික මාධ්‍යවේදය පිළිබඳ මෙම මාර්ගෝපදේශ ග්‍රන්ථය පහත සඳහන් විශේෂඥ මණ්ඩලයේ උපදෙස් සහිතව සකස් කරන ලදි. (පුද්ගල නාමය ආකාරාදී පිළිවෙළට)

- කමන්ති වික්‍රමසිංහ
- කුමුදිනී හෙට්ටිආරච්චි
- ආචාර්ය ජගත් ගුණවර්ධන
- ඩෙනිස් මොම්බවර්
- ආචාර්ය තුසිත සුගතපාල
- ආචාර්ය රංගිකා බණ්ඩාර
- ෂර්ලි උපුල් කුමාර
- මහාචාර්ය සරත් කොටගම
- සරෝජ් පතිරණ

මෙම අත්පොත සඳහා අරමුදල් සපයනු ලැබුවේ USAID ශ්‍රී ලංකාවේ වැඩි ඉල්ලුමක් සහ නියැළීමක් සහිත වගවීම සඳහා වූ (IDEA) ප්‍රදානයෙනි. කැසෙන්ද්‍රා ඩූල් විසින් මෙම මාර්ගෝපදේශ ග්‍රන්ථය සම්පාදනය කරන ලදි.

ශ්‍රී ලංකා පුවත්පත් ආයතනයේ ලිඛිත අවසරයකින් තොරව මෙම ප්‍රකාශනයේ කිසිදු කොටසක් කවර ආකාරයකින් හෝ ප්‍රතිනිෂ්පාදනය කිරීම හෝ සම්ප්‍රේෂණය කිරීම නොකළ යුතුය.

**ඔබේ විමසීම්:**
ශ්‍රී ලංකා පුවත්පත් ආයතනය
96, කිරුළ පාර,
කොළඹ 05. ලිපිනයට යොමු කරන්න
P: +94 (0)11 5 353 635
F: +94 (0)11 5 335 500
info@slpi.lk
www.slpi.lk

---

මෙම සබැඳිය ඔස්සේ ප්‍රකාශනය නොමිලේ බාගතකර හැකිය www.slpi.lk/research-and-surveys/

# පටුන


**හැඳින්වීම** **6**

මේ මාර්ගෝපදේශ ග්‍රන්ථයේ අරමුණ කුමක්ද? **7**

**පරිසරය සහ ජනමාධ්‍ය** **8**

පාරිසරික ජනමාධ්‍ය කලාව වැදගත් ඇයි? 9

පරිසරය සම්බන්ධ කරුණු වාර්තාකරන මාධ්‍යවේදීන් මුහුණදෙන ගැටලු 9

පාරිසරික පුවත් වර්ග සහ තේමා 10

**පරිසර කරුණු වාර්තා කිරීම සම්බන්ධ මාර්ගෝපදේශ** **11**

කතාවක සැකිල්ල ඉදිරිපත් කිරීම 12

පාරිසරික වාර්තාකරණය සඳහා මූලික මාර්ගෝපදේශ 12

1. නිවැරදි ප්‍රශ්න අසන්න 12
2. ගැඹුරින් සොයා බැලීම 13
3. විශේෂඥ මතය 13
4. භාෂාව 13
5. විද්‍යාවේ වැදගත්කම 14
6. නීතිමය කරුණුවල වැදගත්කම 14
7. දේශපාලන පැතිකඩවල වැදගත්කම 14
8. ප්‍රමාණාත්මක දත්ත සහ සංඛ්‍යාලේඛනවල වැදගත්කම 14

**පාරිසරික වාර්තාකරණය සඳහා පියවර කිහිපයක්** **15**

පළමු පියවර: හොඳින් කරුණු විමසා බලන්න 16

දෙවන පියවර: ප්‍රශ්න ලැයිස්තුවක් සකස් කරන්න 16

තුන්වන පියවර: විශේෂඥයන් සමඟ කතා කරන්න 16

හතරවන පියවර: පළමු කෙටුම්පත සම්පාදනය කරන්න 17

පස්වන පියවර: සොයාගත් කරුණු හොඳින් පරීක්ෂා කරන්න 17

හයවන පියවර: සංස්කරණය කරන්න 17

හත්වන පියවර: පසු විපරම් කරන්න 17

**සැලකිලිමත් විය යුතු කරුණු** **18**

1. වැරදි පාරිභාෂිත 19
2. සුදුසුකම් නොලත් විශේෂඥයින්/ තහවුරු නොකළ මූලාශ්‍ර 19
3. න්‍යාය පත්‍ර මත පදනම් වූ අදහස් 19

**පාරිභාෂිත යෙදුම්** **20**

**මූලාශ්‍ර එකතුව** **24**



# හැඳින්වීම

ලොව පුරා විවිධ ආකාරයේ ජනමාධ්‍ය .සම්ප්‍රදායන් පවතී. මුද්‍රිත, විද්‍යුත් හෝ මෑතකාලීනව ජනප්‍රිය වූ ඩිජිටල් මාධ්‍ය වේවා, පාරිසරික ජනමාධ්‍යවේදය සහ වාර්තාකරණය වර්තමානයේ වැදගත්කමක් උසුලන්නේ මිනිසා විසින් පරිසරයට කරන ක්‍රියාවන්හි අහිතකර බලපෑම් ඉහළ යමින් පවතින බැවිනි.

පරිසරය ප්‍රමුඛ  මාතෘකාවක් වන අතර දේශගුණික විපර්යාස, ගෝලීය උණුසුම, තිරසාර සංවර්ධනය සහ මානව වර්ගයාගේ අනාගතය යන කරුණු බොහෝ විට පරිසරය පිළිබඳ පුළුල් සංවාදයට සම්බන්ධ වේ. පෘථිවියේ පැවැත්ම සම්බන්ධයෙන් පවතින සියලුම ගෝලීය තක්සේරු වාර්තා පෙන්නුම් කරන්නේ, ඇතැම් අවස්ථාවල පිළිසකර කළ නොහැකි තරමටම, මිනිසුන් එහි ස්වභාවික ක්‍රියාවලියට බලපෑම් කර ඇති බවය. තත්ත්වය එසේ වුවද, පාරිසරික වාර්තාකරණය සමහර විට පුවත්පත් කලාවේ සැලකිය යුතු අංශයක් ලෙස නොසැලකේ.

එහි අදහස, පාරිසරික ගැටලු වාර්තා කිරීමට ප්‍රමුඛත්වය නොදිය යුතු බව හෝ එය ප්‍රමිතියකින් හෝ වගවීමකින් තොරව කළ යුතුය යන්න නොවේ. මාධ්‍ය කලාවේ සම්මත නීතිවලට අමතරව පාරිසරික මාධ්‍යකරණයේ දී අනුගමනය කළ යුතු ඇතැම් විශේෂ මාර්ගෝපදේශ ද තිබේ. පාරිසරික මාධ්‍යවේදය පිළිබඳ මෙම මාර්ගෝපදේශ ග්‍රන්ථය, පාරිසරික මාධ්‍යවේදියෙකු ලෙස කුසලතා වැඩි දියුණු කිරීමට උපකාරී වන පාරිසරික වාර්තාකරණයේ මූලික කරුණු ගෙනහැර දක්වා තිබේ.

## මෙම මාර්ගෝපදේශ ග්‍රන්ථයේ අරමුණ කුමක්ද?

පරිසර මාධ්‍යවේදීන් ස්වභාවධර්මය රැකගැනීම සහ තිරසාර වෙනසක් උදෙසා සිය හඬ අවදිකරන්නන් වනු ඇතැයි අපේක්ෂා කෙරේ. මාධ්‍යකරණයේ ප්‍රධාන අරමුණ වන දැනුම්වත් සමාජයක් පැවතීම පරිසර සංරක්ෂණය, වගකීම් සහිත පරිභෝජනය සහ කළමනාකරණය සඳහා අත්‍යවශ්‍ය සාධකයකි. කෙසේ වෙතත්, පරිසරය සුරැකීමේ වැදගත්කම සාමාන්‍ය ජනතාවට ඒත්තු ගැන්වීමට උත්සාහ කිරීම පහසු කාර්යයක් නොවේ. සිය පරිභෝජනය සඳහා අසීමිතව ස්වභාවික සම්පත් තිබෙන බව බොහෝ දෙනාගේ විශ්වාසයය. එබැවින් ස්වභාවික සම්පත් අපයෝජනය කිරීම වාර්තා කිරීමට සහ සාකච්ඡා කිරීමට තරම් වැදගත් කරුණක් ලෙස බොහෝ විට නොසැලකේ.

පරිසරයට අදාළ කරුණු වාර්තා කරන බොහෝ මාධ්‍යවේදීන් පහත සඳහන් අභියෝගවලින් එකක් හෝ කිහිපයකට මුහුණ දෙන අතර, එම අභියෝග මෙම මාර්ගෙ ්පදේශ ග්‍රන්ථයේ සාකච්ඡා කෙරේ:

1. පාරිසරික මාධ්‍යකරණය සඳහා අවශ්‍ය නිශ්චිත පුහුණුවක් නොමැතිවීම
2. දත්ත, විද්‍යාත්මක දැනුම සහ විශේෂඥ අදහස් සඳහා ප්‍රමාණවත් ප්‍රවේශයක් නොමැතිවීම
3. පාරිසරික මාධ්‍යවේදීන් සහ පරිසර විශේෂඥයින්/ක්‍රියාකාරීන් අතර නිසි සම්බන්ධීකරණයක් නොමැතිවීම
4. මතවාදවල වෙනස්කම් සහ නොවිසඳුණු ගැටලු
5. පාරිසරික වාර්තාකරණය අභිබවා දේශපාලනය, ආර්ථිකය, ත්‍රස්තවාදය, දරිද්‍රතාවය යනාදී අනෙකුත් විෂයයන් ප්‍රමුඛත්වයට පත්ව ඇත.

මෙම මාර්ගෝපදේශ ග්‍රන්ථයේ අරමුණ වන්නේ මෙම අභියෝග හඳුනා ගැනීම සහ ඒවාට මුහුණ දිය යුතු ආකාරය පිළිබඳ මාර්ගෝපදේශ සැපයීමයි. සෑම කථාවක්ම අද්විතීය සහ වෙනස් වන අතර හඳුනාගත් ඉලක්කගත ප්‍රේක්ෂකයින් වෙත නිශ්චිත ආකාරයකින් වාර්තා කළ යුතුය. මෙම මාර්ගෝපදේශ ග්‍රන්ථය පාරිසරික වාර්තාකරණයේ වඩාත් නොනැසී පවතින හිඩැස් හඳුනා ගනිමින්, ඒවාට ආමන්ත්‍රණය කළ හැකි ආකාරය පිළිබඳ මූලික මාර්ගෝපදේශ සපයමින් පාරිසරික වාර්තාකරණයේ ප්‍රධාන වචන පිළිබඳ පැහැදිලි කිරීමක් සපයයි. පාරිසරික පුවත්පත් කලාවේ වචන, සහ ප්‍රයෝජනවත් සම්පත් ලැයිස්තුගත කරන මෙම ග්‍රන්ථය, එමඟින් මාධ්‍යවේදීන්ට සිය රචනා ශෛලියේ වෙනසක් ඇති කිරීම සඳහා මෙවලම් පරාසයක් ද සපයයි.

# පරිසරය සහ ජනමාධ්‍ය



දැනුම්වත් තීරණ ගැනීමට තුඩු දිය හැකි නිවැරදි සහ විශ්වාසදායක කරුණු සපයන බැවින් මාධ්‍යවේදය යනු සමාජයට අත්‍යවශ්‍ය අංගයකි. එය තොරතුරු බෙදා හැරීමට පෙර කරුණු එක්රැස් කර සත්‍යාපනය කරන වෘත්තියකි.

මාධ්‍ය විසින් පාරිසරික අවදානම පිළිබඳ මහජනතාවගේ සංජානනය පුළුල් කරන අතර එය පරිසර හිතකාමී හැසිරීම් වලට බලපාන බව බොහෝ අධ්‍යයන මගින් පෙන්නුම් කර තිබේ. (Xu & Han, 2019). මේ අනුව, මහජන සහභාගිත්වයට සහ බලගැන්වීමට තුඩු දෙන මහජන බලමුළු ගැන්වීම පිණිස දැනුම්වත් කිරීම් උත්සන්න කිරීම සඳහා මහජනතාවට නිවැරදි තොරතුරු සැපයීම පරිසරය පිළිබඳ වාර්තා කරන මාධ්‍යවේදියා සතු වගකීමකි.

***මාධ්‍යකරණයේ මූලිකම කරුණු - නිරවද්‍යතාවය, සංක්ෂිප්තභාවය සහ පැහැදිලි බව*** *මෙන්ම* ***සංවේදීතාව සහ අවදානමට ලක්වූවන්ට හඬක් දීම*** *මාධ්‍යවේදියෙකු වාර්තාවක් සම්පාදනය කිරීමේදී අනුගමනය කරන ප්‍රධාන කරුණු වේ.*

සරලව ගතහොත් මාධ්‍යකරණය යනු ජනතාව දැනුම්වත් කිරීම සඳහා නිවැරදි කරුණු වාර්තා කිරීමයි. ඔවුන්ට නිසි වේලාවට නිවැරදි තොරතුරු ලැබෙන්නේ නම්, එවිට ඔවුන්ට දැනුම්වත් තීරණ ගැනීමට, හැසිරීම වෙනස් කිරීමට, දැනුම්වත්භාවය වැඩි කිරීමට සහ ප්‍රතිපත්තිවලට බලපෑම් කිරීමට අවස්තාව සැලසේ. වෙනත් වචන වලින් කිවහොත්, මාධ්‍යවේදියෙකු ලිපියක් සම්පාදනය කරන්නේ කිසිවෙකුගේ සිත් ඇදගැනීම පිණිස නොව අදහස් ප්‍රකාශ කිරීමට ය.

පාරිසරික වාර්තාකරණය තුළ මාධ්‍යකරණයේ පදනම් නොවෙනස්ව එලෙසම පවතී. ජනතාව දැනුම්වත් කරන පූර්ණ වාර්තාවක් ගෙන ඒම සඳහා මෙන්ම මාධ්‍යවේදියා හඬක් නැති අය වෙනුවෙන් පෙනී සිටින්නෙකු බවට පත් වීම සහතික කිරීම සඳහා ඇතැම් අමතර අංග ද ඊට ඇතුළත් කෙරේ.

සත්ව වාසස්ථාන අහිමි වීම හා විනාශය, දේශගුණික විපර්යාස සහ වෙනත් විපත් ඇතුළුව ලෝකයේ පාරිසරික ගැටලුවලට විසඳුම් සෙවීම සඳහා පරිසර මාධ්‍යවේදියෙක් අද්විතීය කාර්යභාරයක් ඉටු කිරීමේ වගකීම දරයි. එපමණක් නොව, පාරිසරික මාධ්‍යවේදීන් පාරිසරික අධ්‍යාපනය ද දිරිමත් කළ යුතු අතර තම කටයුතු තුළින් පාරිසරික ගැටලු පිළිබඳව මහජනතාව දැනුම්වත් කළ යුතුය.

## පාරිසරික මාධ්‍යවේදය වැදගත් ඇයි?

සරලම පිළිතුර නම් අදාළ වාර්තාව ඉදිරිපත් කරන මාධ්‍යවේදියා පරිසරය වෙනුවෙන් සහ පරිසර විනාශය හා දූෂණය හේතුවෙන් පීඩාවට පත් වූ පාර්ශ්ව වෙනුවෙන් පෙනී සිටිනු ඇත යන්නයි.

නිදසුනක් වශයෙන්, අලි මිනිස් ගැටුම (HEC) ශ්‍රී ලංකාවේ ප්‍රධාන සමාජ-ආර්ථික හා පාරිසරික ගැටලු වලින් එකකි. එය සැලකිය යුතු අවධානයට ලක්වන අතර මෙම නිදසුනේදී, මිනිසෙකුගේ මරණයට හේතු වූ අලි ප්‍රහාරයක් පිළිබඳව වාර්තා කරන මාධ්‍යවේදියෙකු එය වාර්තා කරන ආකාරය පිළිබඳව විශේෂ අවධානයක් දැක්විය යුතුය.


පාරිසරික ප්‍රවෘත්ති වාර්තා කරන ආකාරය මහජනතාව එයට ප්‍රතිචාර දක්වන ආකාරය, ඒ සම්බන්ධයෙන් ක්‍රියා කරන ආකාරය සහ දිගු කාලීනව රජයේ ප්‍රතිපත්ති සාදන ආකාරය කෙරෙහි සෘජු බලපෑමක් ඇති කරයි.

මේ අනුව, සියලුම පරිසර මාධ්‍යවේදීන් මාධ්‍ය කලාවේ මූලික කරුණු වලට අමතරව පහත සඳහන් සම්මතයන් සිහි තබා ගැනීම වැදගත්ය.

### පාරිසරික ගැටලු වාර්තා කරන මාධ්‍යවේදීන් මුහුණ දෙන ගැටලු

- පාරිසරික වාර්තාකරණය සඳහා වෙන් කර ඇති සීමිත ඉඩ හෝ ගුවන් කාලය
- විවිධ බාහිර සාධක හේතුවෙන් ප්‍රවෘත්ති ලිපි හෝ වාර්තා පළ නොකිරීම
- නිවැරදි කරුණු සහ සාක්ෂි ලබා ගැනීමේ අපහසුව
- ප්‍රවෘත්ති වාර්තාවල කාලෝචිත බව
- අදාළ මූලාශ්‍ර ලබා ගැනීම
- නවීන පාරිසරික ගැටලු සම්බන්ධයෙන් මතුවන සංකීර්ණ ප්‍රශ්න
- වාර්තාවේ විද්‍යාත්මක පැතිකඩ හඳුනාගැනීමේ අපහසුව
- දේශපාලන හෝ වෙනත් බාහිර බලපෑම් හේතුවෙන් ඇති වන තර්ජන

## පාරිසරික පුවත් වර්ග




පාරිසරික වාර්තාකරණයේදී ඉහත සඳහන් කළ පුවත් වර්ග පහත තේමාවන් එකක් හෝ කිහිපයක් කෙරෙහි අවධානය යොමු කරනු ඇත:

1. පරිසරය විනාශ කිරීම හා පිරිහීම (වන විනාශය, පාරිසරික විපත්, වාසස්ථාන අහිමි වීම ආදිය)
2. පාරිසරික ගැටලු සහ විසඳුම් (දූෂණය, තිරසාර සංවර්ධනය, ආදිය)
3. දේශගුණික විපර්යාස
4. මිනිසුන් සහ වන ජීවීන් අතර ගැටුම් (මිනිස් - අලි ගැටුම, මිනිස් - කිඹුල් ගැටුම, මිනිස් - දිවියන් ගැටුම, ආදිය)
5. පරිසර නීති (නීති/රෙගුලාසි)
6. නව සොයාගැනීම් සහ නවෝත්පාදන
7. දේශීය ප්‍රතිපත්ති, ප්‍රමිති, දේශීය නීති, ගැසට්, රාමුව, ක්‍රියාකාරී සැලසුම්, ප්‍රධාන සැලසුම්, ජාත්‍යන්තර සම්මුතීන්, ක්‍රියාවලි සහ සමුළු

# පාරිසරික වාර්තාකරණය පිළිබඳ මාර්ගෝපදේශ



ශ්‍රී ලංකාවේ පාරිසරික වාර්තාකරණය පිළිබඳව අපක්ෂපාතීව සලකා බලන විට, පිළිගත් වාර්තාකරණ භාවිතයන් සහ සත්‍ය වශයෙන්ම ප්‍රවෘත්ති ඉදිරිපත් කර ඇති ආකාරය අතර වෙනස හොඳින් දක්නට ලැබේ. එමගින් ශ්‍රී ලංකාවේ පාරිසරික වාර්තාකරණයට බලපාන දේශපාලන පක්ෂග්‍රාහීත්වයට අමතරව මාධ්‍යවේදීන් සහ පරිසර විශේෂඥයින්/ක්‍රියාකාරීන් අතර ඇති දුරස්ථභාවය පැහැදිලි වේ.

## මාතෘකාවක් ඉදිරිපත් කිරීම (pitching)

වාර්තාවේ අන්තර්ගතය, ඉලක්ක කණ්ඩායම සහ එය ප්‍රකාශයට පත්කරන සංවිධානය යනාදී ලෙසින් විවිධ ආකාර කිහිපයකින් වාර්තාවක් ගොඩනැංවිය හැකිය. කෙසේ වෙතත්, ඉදිරිපත් කරන්නේ කවදාද සහ කෙසේද යන්න අමතක නොකළ යුතුය. පාරිසරික වාර්තාකරණය සඳහා ලබා දී ඇති ඉඩ සීමිත බැවින්, වාර්තාවේ ප්‍රවේශය සහ බලපෑම උපරිම වන පරිදි කාලෝචිත ආකාරයකින් කතුවරයෙකුට හෝ නිෂ්පාදකයෙකුට අදහසක් ඉදිරිපත් කිරීම ඉතා වැදගත් වේ. සමහර උදාහරණ නම්:

- පරිසරය වෙනුවෙන් කැප වූ දින (ලෝක පෘථිවි දිනය, ලෝක පරිසර දිනය, නිල් අහස සඳහා පිරිසිදු වාතය පිළිබඳ ජාත්‍යන්තර දිනය, ජාත්‍යන්තර වඳුරන්ගේ දිනය, යුද්ධයේදී සහ සන්නද්ධ ගැටුම්වලදී පරිසරය සූරාකෑම වැළැක්වීමේ ජාත්‍යන්තර දිනය, ආදිය)
- ප්‍රධාන පාරිසරික සමුළුවක් පැවැත්වෙන කාලවලදී (එක්සත් ජාතීන්ගේ දේශගුණික විපර්යාස සමුළුව, එක්සත් ජාතීන්ගේ ජෛව විවිධත්ව සමුළුව, එක්සත් ජාතීන්ගේ සාගර සමුළුව, ආදිය)
- වර්තමාන ප්‍රාදේශීය හෝ කාලගුණ විද්‍යා සිද්ධීන් (අධික වර්ෂාව, ගංවතුර, සුළි කුණාටු, වන විනාශය, HEC, ආදිය)
- පාරිසරික ගැටලු සඳහා වැඩසටහන්/පුවත්පත්වල නිත්‍ය කාල පරාසයන්/ඉඩ භාවිත කිරීම

මාධ්‍යවේදීන් දුරකථනයෙන් කරුණු රැස් කරනවාට වඩා පුවත් වාර්තා කිරීමේදී හැකි සෑම විටම අදාළ ස්ථානවලට පෞද්ගලිකව පැමිණීම අත්‍යවශ්‍ය වේ. එමගින් අදාළ ගැටලුව පිළිබඳ සැබෑ චිත්‍රයක් ලබාගැනීමට ඔවුන්ට හැකි වනු ඇත. නිදසුනක් වශයෙන්, බලධාරීන් නීති විරෝධී හෝ වැරදි දෙයක් කරන්නේද නැතහොත් විශේෂඥයන් ඔවුන්ගේ අදහස්වලට එරෙහිව කරුණු සපයන්නේද යනාදී කරුණු හොඳින් විමසා බැලීමට එවිට ඔවුන්ට අවස්ථාව සැලසේ. කිසියම් සිදුවීමක් පිළිබඳ නිවැරදි වාර්තාකරණයක් සැපයීමෙහිලා මාධ්‍යවේදීන් එම ස්ථානයට ගොස් කරුණු විමසීම සහ වාර්තාවට අදාළ සියලු පාර්ශව ඇතුළත් කරගැනීම දිරිගන්වනු ලැබේ.

## පාරිසරික වාර්තාකරණය සඳහා මූලික මාර්ගෝපදේශ

ක්‍රියාකාරීන් හෝ විශේෂඥයින් මහජනතාවගේ අවධානයට යොමු කිරීමට බලාපොරොත්තු වන අදහස්/මතයන් සහ මහජනතාවගේ අවධානයට ලක් වී ඇති කරුණු අතර පරතරය බොහෝ මාධ්‍යවේදීන්ට නොවැටහීම, පරිසර මාධ්‍යවේදීන් සහ පරිසර විශේෂඥයින්/ක්‍රියාකාරීන් ගේ අවධානයට ලක් වී තිබෙන තවත් ප්‍රධාන කරුණකි.

මාධ්‍යවේදියාගේ දෘෂ්ටිකෝණයෙන්, ඔවුන්ට අවශ්‍ය වන්නේ සිදුවීමක් වාර්තා කිරීමට පමණි .එහෙත් බොහෝ විට ඔවුන් ක්‍රියාකාරීන් සහ විශේෂඥයින් අතර වාද විවාදවල හෝ ප්‍රශ්නයේ ඇති දේශපාලන තර්ක තුළ පැටලී සිටිති. සරල මාර්ගෝපදේශ කිහිපයක් අනුගමනය කිරීමෙන් සහ අදාළ අවස්ථාවලදී ඒවා ඇතුළත් කිරීමෙන් මෙම ගැටලුව පහසුවෙන් වළක්වා ගත හැකිය.

1. **නිවැරදි ප්‍රශ්න අසන්න**

වාර්තා කළ යුතු දේ සහ වඩාත්ම අවධානයට ලක්වන කතාව ලෙස සැලකෙන දේ අතර පරතරය පියවා ගැනීම සඳහා මාධ්‍යවේදීන් විශේෂඥයින් සමඟ කතා කිරීමේදී නිවැරදි ප්‍රශ්න ඇසීම අත්‍යවශ්‍ය වේ. මේ සඳහා මාධ්‍යවේදියාගේ පැත්තෙන් සූදානම් වීමේ මට්ටමක් අවශ්‍ය වන්නේ නිවැරදි ප්‍රශ්න නොඇසුවේ නම් සැබෑ කතාව නැති වී යන බැවිනි.

නිදසුනක් වශයෙන්, මියගිය තල්මසෙකු වෙරළට ගසාගෙන ආවොත්, ඒ පිළිබඳ වාර්තාව තල්මසෙකු වෙරළට ගසාගෙන ආ බවට ප්‍රවෘත්තිය ඉක්මවා යා යුතුය. මෙය කොපමණ වාරයක් සිදු වන්නේද යන්න සහ පැහැදිලි ලෙස ඔබ්බට යන හේතුවක් තිබේද යන්න ලිපියෙන් සොයා බැලිය යුතුය.

## 2. ගැඹුරින් සොයා බලන්න

පාරිසරික පුවත්පත් කලාවේ ද ඉතිහාසය විශාල කාර්යභාරයක් ඉටු කරයි. වර්තමානය තේරුම් ගැනීමට නම්, වර්තමානයට හේතු වූ අතීතයේ තත්වයන් තේරුම් ගැනීම වැදගත්ය.

හොඳම උදාහරණය ශ්‍රී ලංකාවේ අලි මිනිස් ගැටුමයි. අලි ඇතුන් මිනිස් ජනාවාසවලට පැමිණීම පිළිබඳ වාර්තා මෑත කාලයේ බහුලව වාර්තා වූයේ ඇයි? අලි මිනිස් ගැටුමෙන් සිදුවූ හානිය තක්සේරු කරන්නේ කෙසේද?

මෙම ප්‍රශ්නවලට පිළිතුරු තේරුම් ගැනීමට නම්, මිනිසුන් වන අලින්ගේ වාසස්ථාන ආක්‍රමණය කර, එමඟින් ඔවුන්ගේ වාසස්ථාන අවම කර ආහාර සොයා ගැනීමේ ඉතිහාසය දෙස බැලිය යුතුය. යමෙක් රජය විසින් සිදු කරන සංවර්ධන ව්‍යාපෘති තාවකාලිකව විමර්ශනය කළ යුතු අතර වන සතුන්ට සහ ඔවුන්ගේ වාසස්ථානවලට ඒවායේ බලපෑම පිළිබඳව විශේෂඥයන්ගෙන් උපදෙස් ලබා ගත යුතුය. තිරසාර විසඳුම් ලබා ගැනීම සඳහා මූලික හේතු සොයා ගැනීම වැදගත් වේ. මේ සම්බන්ධයෙන් භාවිත කරන තාක්ෂණික යෙදුම "මූල හේතු විශ්ලේෂණය (RCA)" වේ.

## 3. විශේෂඥ මතය

පරිසරය පිළිබඳ ලිපියක් ලිවීමේදී හෝ පරිසරය හා සම්බන්ධ සිදුවීමක් ලිවීමේදී ක්ෂේත්‍රයේ ප්‍රවීණයෙකුගෙන් අදහස් ලබා ගැනීම අවශ්‍ය වේ. මාධ්‍යවේදියාගේ වගකීම වන්නේ එම මතය ජනතාවට පහසුවෙන් ග්‍රහණය වන අයුරින් ප්‍රකාශ කිරීමයි. විශේෂඥ මතය මත පදනම්ව තමන්ගේම අදහස් හෝ නිගමන ඉදිරිපත් නොකිරීමට වගබලා ගත යුතුය. පාරිසරික ගැටලුවක සෑම අංශයකම සූක්ෂ්මතා මාධ්‍යවේදීන් නොදැන සිටිය හැකි අතර ඒවා එසේ වුවද, කරන ලද ප්‍රකාශයන් සනාථ කිරීම සඳහා ප්‍රවීණයෙකුගේ මතය ලබා ගැනීම අත්‍යවශ්‍ය වේ.

ප්‍රවීණයෙකු ලෙස හැඳින්වූ පමණින් ඔවුන් පරිසරය හා සම්බන්ධ සෑම ක්ෂේත්‍රයකම ප්‍රවීණයන් බවක් නොඇඟවෙන බව ද මාධ්‍යවේදියා මතක තබා ගත යුතුය. තමන් අදහස් ලබා ගන්නා විශේෂඥයා එම ක්ෂේත්‍රයේ ප්‍රවීණයෙකු බව සහතික කර ගැනීම මාධ්‍යවේදියාට සම්බන්ධ සියලු දෙනාගේ වගකීමකි.

උදාහරණයක් ලෙස, කඩොලාන සංරක්ෂණය පිළිබඳ පුවතක් වාර්තා කිරීමේදී, අදහස් දැක්වීම කඩොලාන පිළිබඳ විශේෂඥයෙකුගෙන් විය යුතුය. කඩොලාන ගැන තල්මසුන් පිළිබඳ විශේෂඥයෙකුගෙන් අදහස් ලබා ගැනීම ප්‍රායෝගික නොවන අතර එය අර්ථයක් නැති දෙයකි.

මෙයද වැදගත් වන්නේ පරිසරය පිළිබඳ වාර්තා කිරීමේ ප්‍රධාන අරමුණ විසඳුමක් සෙවීම නිසාය. වාර්තාව සඳහා අවශ්‍ය වන්නේ පවතින ප්‍රශ්නය ඉස්මතු කර විසඳුමක් යෝජනා කිරීමයි. මුහුණ දෙන අභියෝග සඳහා විශේෂඥභාවය සහ ප්‍රායෝගික විසඳුම් ප්‍රවීණයන් සමඟ පමණක් නොව දේශීය/සාම්ප්‍රදායික ප්‍රජාවන් සමඟ ද සමාජය තුළ ද පැවතිය හැකි බව මෑතකදී අවබෝධ කර ගෙන පිළිගෙන ඇත.

## 4. භාෂාව

භාවිතා කරන ඕනෑම භාෂාවක - එය සිංහල, දෙමළ හෝ ඉංග්‍රීසි වේවා - වාක්‍ය බණ්ඩනය කරන ආකාරය වැදගත් වේ. මාධ්‍යවේදියෙකු කතාව සැකසිය යුතු ආකාරය තේරුම් ගත යුතු අතර එය පැහැදිලිව සන්නිවේදනය කිරීමට වග බලා ගත යුතුය. ඔබේ පිටපතේ පළමු විවේචනාත්මක පාඨකයා ඔබයි. ඔබට එය නොතේරෙන්නේ නම්, එය ලියන්න එපා.

තව දුරටත්, භාෂාවේ වැදගත්කම අවධාරණය කරනුයේ කථාවක් ඕනෑවට වඩා මතවාදී නම්, එය තවත් හානියක් විය හැකි බැවිනි. ව්‍යාකූලත්වය වළක්වා ගැනීම සඳහා සත්‍යය සහ මතය අතර වෙනස හඳුනා ගැනීමට මාධ්‍යවේදියාට හැකි විය යුතුය.

### 5. විද්‍යාවේ වැදගත්කම

පාරිසරික ජනමාධ්‍යවේදය කෙරෙහි යොමුවන ඇතැම් මාධ්‍යවේදීන් විද්‍යාත්මක වචන සහ පාරිභාෂිත තුළ අතරමං වන අතර ඇතැම් විට ඔවුහු සම්පූර්ණයෙන්ම එයින් ඉවත් වීමට තීරණය කරති. අදාළ වාර්තාවට වලංගු භාවයක් සහ විශ්වාසණීයභාවයක් ලබා දෙන්නේ විද්‍යාව බැවින් විශේෂයෙන්ම පාරිසරික මාධ්‍යකරණයේදී විද්‍යාවේ වැදගත්කම අවධාරණය කළ යුතුය.

කිසියම් වාර්තාවක් පරිපූර්ණ වන්නේ නිශ්චිතව සිදු කරන ලද නිසි පර්යේෂණයකින් වාර්තා කළහොත් පමණි. මෙහිදී විද්වත් මතය යනු එක් කොටසක් පමණි, පාරිසරික ප්‍රශ්නයක් පිටුපස ඇති විද්‍යාත්මක ක්‍රියාවලිය මහජනතාවට ග්‍රහණය කර ගත හැකි අයුරින් පැහැදිලි කිරීමට මාධ්‍යවේදියාට හැකි විය යුතුය.

සරලව, කිසියම් වාර්තාවක වැදගත්කම අවබෝධ කර ගැනීම සඳහා ග්‍රාහකයින්ට ස්වභාවික ලෝකයේ ක්‍රියාවලිය අවබෝධ කර ගත යුතු බැවින් විද්‍යාව ඉතා වැදගත්ය.

### 6. නීතිමය අංශයේ වැදගත්කම

විද්‍යාව මෙන්ම පාරිසරික ගැටලු වල නීතිමය පැතිකඩද වැදගත් වේ. ප්‍රතිපත්ති/නීති සකස් කිරීමේදී, මහජන අදහස් සඳහා අවකාශයක් ලබා දෙන බැවින් මාධ්‍යවේදීන් අදාළ මාතෘකාව පිළිබඳ මහජනතාව දැනුම්වත් කිරීමේ විශාල අවශ්‍යතාවයක් පවතී. නිදසුනක් වශයෙන්, රක්ෂිත ප්‍රදේශවල සිදුවන සංවර්ධන ව්‍යාපෘති සහ ආවේණික ශාක හා සත්ත්ව විශේෂවලට බලපාන සංරක්ෂණය පිළිබඳ වාර්තා කිරීමේදී නීති සහ ගැසට් විශේෂයෙන් අදාළ වේ. පාරිසරික ගැටලුවක නීතිමය පැතිකඩ පිළිබඳ මාධ්‍යවේදියාගේ දැනුවත්භාවය එම ගැටලුවට විසඳුම් සෙවීමට නීතිමය ක්‍රියාමාර්ග අවශ්‍ය වන විටකදී ජනතාව දැනුවත් කිරීමට මාධ්‍යවේදියෙකුට ඉඩ සලසයි.

### 7. දේශපාලන පැතිකඩවල වැදගත්කම

පාරිසරික වාර්තාකරණයේ තවත් කැපී පෙනෙන අභියෝගයක් වන්නේ, විශේෂයෙන්ම ශ්‍රී ලාංකේය සන්දර්භය තුළ, ඇතැම් පාරිසරික ගැටලු කොපමණ දේශපාලනීකරණය වී ඇත්ද යන්නයි. එබැවින්, පරිසර මාධ්‍යවේදියෙකු යම් වාර්තාවක හෝ විමර්ශනයක දේශපාලන පැතිකඩ කෙරෙහි ද දැඩි අවධානයක් යොමු කළ යුතු අතර, ඔවුන් සෑම විටම අපක්ෂපාතීත්වය ප්‍රදර්ශනය කළ යුතුය.

### 8. ප්‍රමාණාත්මක දත්ත සහ සංඛ්‍යාලේඛනවල වැදගත්කම

ප්‍රමාණාත්මක දත්ත සහ සංඛ්‍යාලේඛන පාරිසරික වාර්තාකරණයට වැඩි වටිනාකමක් එක් කරන ක්‍රම කිහිපයක්:

- ඉන්ෆොග්‍රැෆික්ස් සහ ප්‍රස්ථාර හරහා වාර්තාව මගින් ප්‍රකාශ කරන ලද තොරතුරු දෘශ්‍යකරණය කිරීම
- සාකච්ඡා කර ඇති ගැටලු සඳහා වලංගුභාවය සහ සත්‍යාපනය ලබා දීම
- වැඩිදුර විශ්ලේෂණය සඳහා අවස්ථාව ලබා දීම
- ප්‍රවණතා සහ වර්ධනයන් වඩාත් පහසුවෙන් හඳුනා ගැනීමට අවස්ථාව සලසා දීම

## පාරිසරික වාර්තාකරණය සඳහා පියවර කිහිපයක්

පරිසර මාධ්‍යවේදය පරිසර ක්‍රියාකාරීන්ට පාරිසරික ගැටලු, සංරක්ෂණය සහ තිරසාරභාවය පිළිබඳව දැනුම්වත් කිරීමට ඇති අවස්ථාවක් බවට පත්ව තිබෙන නමුත් අතීතයට සාපේක්ෂව වර්තමානයේ පරිසර මාධ්‍යවේදීන්ගේ අඩුවක් දක්නට ලැබේ.

නිවැරදිව ලිපියක් සම්පාදනය කිරීම මඟින්, පරිසරය පිළිබඳ ජනතාව දැනුම්වත් කළ හැකි අතර සමස්තයක් වශයෙන් සමාජයට බලපෑමක් ඇති කළ හැකිය.
පහත පියවරයන් මඟීන් වැදගත් ලිපියක් සම්පාදනය කිරීම පිණිස අවශ්‍ය ක්‍රියාවලිය විස්තර කෙරෙන අතර, කථාවේ මූලික සැකිල්ලක් නිර්මාණය කැන පියවර තුළදීම අදාළ සියලුම අංග ආවරණය කර ඇති බවට විස්තීරණ සමාලෝචනයක් මඟින් සහතික කරයි.



### පළමු පියවර
## හොඳින් කරුණු හදාරන්න

පාරිසරික සිදුවීමක් විමර්ශනය කරන විට, ආරම්භයක් ලෙස කළ හැකි වන්නේ විෂය පිළිබඳ වැඩිදුර දැන ගැනීම සඳහා අන්තර්ජාලයේ ඇති පොත් හෝ මූලාශ්‍ර වෙත යොමු වීමයි.

මේ හරහා සිදුවීම තුළ අධ්‍යයනය කළ යුතු ප්‍රශ්න මොනවාදැයි දැන ගැනීමට ප්‍රමාණවත් දැනුමක් ලබා ගත හැකි ය.

සෑම මාතෘකාවක් සඳහාම තොරතුරු ලබා ගත හැකි බහු මූලාශ්‍ර පවතී. ලිපියේ අවධානයට ලක් කිරීමට අදහස් කරන මාතෘකාව අනුව මෙය වෙනස් වුවද, වඩාත් ජනප්‍රිය මූලාශ්‍ර කිහිපයක් නම්:

- ආණ්ඩුවේ ආයතන
- පරිසරවේදීන් සහ පාරිසරික ක්‍රියාකාරී කණ්ඩායම්
- ඇතැම් ක්ෂේත්‍ර සහ තේමා පිළිබඳ විද්වතුන්/ප්‍රවීණයන් (සාගර ජීව විද්‍යාව, පාරිසරික නීතිය, පක්ෂි විද්‍යාව, පරිසර විද්‍යාව, වායු දූෂණය, ආදිය)
- ග්‍රන්ථ සහ ලිපි එක්රැස් කර තිබෙන ස්ථාන (පුස්තකාල වැනි)
- විද්‍යාත්මක පර්යේෂණවල වාර්තා
- පිළිගත් සිවිල් සමාජ සංවිධාන, රාජ්‍ය නොවන සංවිධාන, එක්සත් ජාතීන්ගේ ආයතන සහ වෙනත් මූලාශ්‍ර විසින් සකස් කරනු ලැබ තිබෙන ප්‍රතිපත්ති ලේඛන සහ ව්‍යාපෘති වාර්තා

### දෙවන පියවර
## ප්‍රශ්න ලැයිස්තුවක් සකස් කරන්න

ඔබ නිවැරදිව සොයාබැලුවොත්, යහපත් මූලික පර්යේෂණයක් මගින් පිළිතුරු අවශ්‍ය ප්‍රශ්න මොනවාද යන්න සොයා ගත හැකිය. මෙම ප්‍රශ්නවලින් සමහරක් ඔබේ ලිපියේ අවධානය යොමුකරන මූලික ගැටලුව ආවරණය කරන බැවින් ඒවා සියල්ලම ලැයිස්තුගත කරන්න.

උසස් තත්වයේ ලියවිල්ලක පාඨකයාගේ මනසට නැගෙන ප්‍රශ්නවලට පිළිතුරු තිබිය යුතුය. ඒ නිසා ඔබේ ප්‍රශ්න ලැයිස්තුව ගෙන විශේෂඥ අදහස් අවශ්‍ය වන ප්‍රශ්න මොනවාදැයි කරන්න.

### තුන්වන පියවර
## විශේෂඥයන් සමඟ කතා කරන්න

පාරිසරික ගැටලු සම්බන්ධ ලිපියක් සම්පාදනයේදී විශේෂඥ මතවල වැදගත්කම අවධාරණය කිරීම වටී. ලිපියට අදාළ විශේෂඥයන් ගවේෂණය කර ඔවුන් සමඟ කතා කරන්න. ඔවුන්ගේ ප්‍රතිචාර කෙරෙහි විශේෂ අවධානයක් යොමු කළ යුතුය.

මාතෘකාවට අදාළ නිවැරදි විශේෂඥයා සොයා ගැනීම සාරගර්භ ලිපියක් සම්පාදනයේදී වැදගත්ම කරුණකි. විශේෂඥයින්ගේ ප්‍රකාශන අධ්‍යයනය කිරීම මගින් ඔවුන්ගේ ප්‍රවීණතා ක්ෂේත්‍රය පිළිබඳ අදහසක් ලබා ගැනීම සුදුසු ය. විශේෂඥයින් විසින් මීට පෙර පවත්වන ලද සම්මුඛ සාකච්ඡා මෙන්ම ඔවුන්ගේ නිල වෙබ් අඩවි ද ලිපිය සඳහා ඔවුන්ගේ විශේෂඥභාවයේ අදාළත්වය පිළිබඳ ඉඟි සපයනු ඇත.

විශේෂඥ මතය අනුව ලිපියේ අවධානය යොමුවන අංශ බරපතල අන්දමින් වෙනස් විය හැකිය. සමබර වාර්තාවක් ලබා ගැනීම සඳහා එක් අයෙකුට වඩා කතා කිරීම වැදගත් වුවත්, ඔවුන්ගේ පරස්පර අදහස් ගැනද ප්‍රවේශම් විය යුතු ය. සමහර විශේෂඥයින්ට ලිපියට අදාළ නොවන සැඟවුණු න්‍යාය පත්‍රයක් තිබිය හැකිය. මාධ්‍යවේදියෙකු ලෙස, ඔබේ කාර්යය වන්නේ වෙනත් කෙනෙකුගේ න්‍යාය පත්‍රය ඉදිරියට ගෙන යාම නොව ඔබගේ පාඨකයා දැනුම්වත් කිරීමයි.

### හතරවන පියවර

## පළමු කෙටුම්පත සම්පාදනය කරන්න

පළමු කෙටුම්පත තුළ ලිපියේ ආවරණය කිරීමට අදහස් කළ ප්‍රධාන ප්‍රශ්න සඳහා පිළිතුරු සම්පාදනය කරමින්, දුෂ්කර වචන සහ කරුණු සරලව විස්තර කරමින් සහ වාර්තාවේ ප්‍රධාන තොරතුරු හෝ තර්ක විශේෂඥ මතය සමඟ ඉදිරිපත් කළ යුතු ය. මෙය ප්‍රකාශකයා විසින් ඉල්ලා සිටින ලද වචන ගණන සහ අනෙකුත් මාර්ගෝපදේශ ඉක්මවා යනු ඇති බවට සැකයක් නැත.

පළමු කෙටුම්පත හෝ දළ පිටපත ලේඛකයාගේ සිතුවිලි සුසංයෝගී ලිපියක් ලෙස සංවිධානය කිරීමට උපකාරී වේ. මෙම කෙටුම්පතට විස්තර එකතු කිරීම හෝ සංස්කරණය කිරීමෙන් වඩා හොඳ පිටපතක් ලබා ගත හැකිය.

### පස්වන පියවර

## කරුණු දෙවරක් පරීක්ෂා කරන්න

කෙටුම්පත කියවීම, කරුණු සහ ඒවායේ මූලාශ්‍ර යළිත් පරීක්ෂා කිරීම, අවශ්‍ය නම්, ඒවායේ උපුටා දැක්වීම් තහවුරු කරගැනීම වැදගත් පියවරයන් වේ. උපුටා දැක්වීම්, කෙටි යෙදුම්, විද්‍යාත්මක වචන, ප්‍රධාන අංක සහ ලිපියේ සත්‍යතාව වැඩි කිරීමට එකතු කරන වෙනත් ඕනෑම දෙයක් යළිත් පරීක්ෂා කර බැලීම වැදගත් ය.

### හයවන පියවර

## සංස්කරණය කරන්න

මාධ්‍යවේදියෙකුගේ නරකම විවේචකයා ද තමන්ම විය යුතුය. ප්‍රේක්ෂකයාගේ දෘෂ්ටිකෝණයෙන් කතාව කියවා / පරිකල්පනය කර එය හොඳින් සංස්කරණය කරීම කළ යුතුය.

### හත්වන පියවර

## පසු විපරම් කිරීම

පාරිසරික ගැටලු පිළිබඳ වාර්තා එක් වාර්තාවකින් අවසන් වන්නේ ඉතා කලාතුරකිනි. සිය වාර්තාව ගැන පසු විපරම් කිරීම, ගැටලුවට අදාළ යම් ක්‍රියාමාර්ගයක් ගෙන තිබේද යන්න සොයා බැලීම, යම් වෙනස්වීමක් ඇත්නම් ඒ පිළිබඳව වාර්තා කිරීම සහ විසඳුමක් ඇත්නම් යෝජනා කිරීම මාධ්‍යවේදියා සතු ය.

විශේෂඥයින් සහ ක්‍රියාකාරීන් සමඟ සම්බන්ධව සිටීම, ඔවුන් සමඟ පසු විපරම් කිරීම හරහා අමතර කතාවලට අදාළ තොරතුරු ලබා ගත හැකිය.

# සැලකිලිමත් විය යුතු කරුණු



ඕනෑම ආකාරයක මාධ්‍යකරණයක් මෙන්, පාරිසරික මාධ්‍යවේදය ද සංකීර්ණ විය හැකිය. වාර්තාවක් සකස් කිරීමේදී සැලකිලිමත් විය යුතු කරුණු කිහිපයක් තිබේ.

1. **වැරදි පාරිභාෂිත**
   වැරදි පාරිභාෂිත වචන භාවිතා කිරීමෙන් පාඨකයා නොමඟ යා හැකි ය. ඔබ භාවිත කිරීමට වඩාත්ම සුදුසු පදය අවිනිශ්චිත නම්, විශේෂඥයෙකුගෙන් විමසීම කළ හැකි ය. පවතින ගැටලු පැහැදිලි කිරීම සඳහා නව වචන නිර්මාණය කිරීමෙන් වැළකිය යුතු ය.

2. **සුදුසුකම් නොලත් විශේෂඥයින්/ තහවුරු නොකළ මූලාශ්‍ර**
   ක්ෂේත්‍ර ගණනාවක ප්‍රවීණත්වය සහිත විශේෂඥයින් අතලොස්සක් සිටියද, බොහෝ අය පරිසරයට අදාළ එක ක්ෂේත්‍රයක පමණක් විශේෂඥ දැනුමක් දරයි. ඔවුන්ට සාමාන්‍යයෙන් විශේෂිත ක්ෂේත්‍රයක විෂය කරුණු පිළිබඳ විශේෂඥ දැනුමක් ඇති අතර එම ප්‍රදේශයෙන් ඔබ්බට යන මාතෘකා සඳහා ප්‍රවීණයන් ලෙස සඳහන් නොකළ යුතුය. ඒ හා සමානව, පාරිසරික ගැටලු පිළිබඳව අන්තර්ජාලයේ බොහෝ මූලාශ්‍ර තිබේ. ඔබගේ වාර්තාවට විශ්වසනීයත්වය ලබා දීම සඳහා පුද්ගලයන් උපුටා දැක්වීමෙන් හෝ තහවුරු නොකළ මූලාශ්‍ර උපුටා දැක්වීමෙන් වළකින්න. ලිපියක් තුළ ඇති තර්ක හෝ විශේෂඥයින්ගේ උපුටන මගින් විශ්වාසදායක මෙන්ම සත්‍යාපිත තොරතුරු ලබා දෙන බවට සහතික විය යුතු ය.

3. **න්‍යාය පත්‍ර මත පදනම් වූ අදහස්**
   විශේෂඥයෙකු සිය පුද්ගලික මතය යතාර්ථය ලෙසින් ඉදිරිපත් කරන අවස්ථා හෝ වෙනත් අරමුණක් සහිතව අදහසක් ලබා දෙන අවස්ථා ඇතැම්විට මාධ්‍යවේදීන් අත්විඳ තිබිය හැකිය. මාධ්‍යවේදියකුගේ යුතුකම ජනතාව දැනුම්වත් කිරීම මිස වෙනත් කෙනෙකුගේ අරමුණු ඉදිරියට ගෙන යාම නොවන බව සිහියේ තබාගෙන මෙම මෙවැනි අවස්ථාවලින් ප්‍රවේශම් විය යුතු ය.

## මූල පද

පහත ලැයිස්තු ගත කර ඇත්තේ පාරිසරික ගැටලු සහ දේශගුණික විපර්යාස වාර්තා කිරීමේදී භාවිත කරන වඩාත් වැදගත් පාරිභාෂික සහ කෙටි යෙදුම් කිහිපයකි. මෙම යෙදුම්වල අර්ථය දැන ගැනීම පාරිසරික විශේෂඥයින් විසින් බොහෝ විට භාවිත කරන ඇතැම් ගැටලු සහ සංකල්ප තේරුම් ගැනීමට ඔබට උපකාර වනු ඇත.

| යෙදුම | කෙටි යෙදුම | අර්ථ දැක්වීම |
|---|---|---|
| දේශගුණික සවිබල ගැන්වීම සඳහා ක්‍රියාමාර්ග | ACE | අධ්‍යාපනය, පුහුණුව, දැනුම්වත් කිරීම්, තොරතුරු වෙත ප්‍රවේශය, මහජන සහභාගීත්වය සහ ජාත්‍යන්තර සහයෝගීතාවය හරහා දේශගුණික ක්‍රියාකාරකම්වල නිරත වීමට විවිධ පාර්ශ්වකරුවන් (සිවිල් සමාජය සහ තරුණයින් ඇතුළුව) බල ගැන්වීම |
| අනුවර්තන කළමනාකරණය | AM | ස්වාභාවික පරිසර පද්ධති වැනි හැසිරීම් පූර්වකථනය කළ නොහැකි පද්ධති තුළ ඇති ආවේනික අවදානම් සහ අවිනිශ්චිතතාවයන් ජය ගැනීම සඳහා කාර්යක්ෂම හා ඵලදායී ඉගෙනීමේ ක්‍රියාවලියක යෙදීම හරහා පාරිසරික කළමනාකරණය සඳහා පුළුල් විද්‍යාත්මක ප්‍රවේශයක් ලබා ගැනීම |
| ජෛව විවිධත්වය (ජීව විද්‍යාත්මක විවිධත්වය ලෙසද හැඳින්වේ) | - | වැසි වනාන්තරයක් වැනි නිශ්චිත වාසස්ථානයක ඇති විශේෂ, උප විශේෂ හෝ ප්‍රජාවන්ගේ පරාසය |
| ජෛවගෝලය (පරිසරගෝලය ලෙසද හැඳින්වේ) | - | ජලගෝලය සහ වායුගෝලයේ කොටස් ඇතුළුව ජීවීන් සිටින පෘථිවියේ කොටස සහ අවට අවකාශය |
| සංගණනය | - | සංඛ්‍යා සහ අනෙකුත් ලක්ෂණ තක්සේරු කිරීම සඳහා නිශ්චිත ජනගහනයක් පිළිබඳ සමීක්ෂණයක් |
| දේශගුණික හා ආපදා අවදානම් මූල්‍ය සහ රක්ෂණය | CDRFI | මූල්‍ය ඔරොත්තු දීමේ හැකියාව වැඩි දියුණු කරන සහ/හෝ දේශගුණික සහ දේශගුණයට සම්බන්ධ නොවන ආපදා සහ අනපේක්ෂිත කම්පනවලට ප්‍රතිචාර දැක්වීම සඳහා මූල්‍ය පහසුකම් සපයන පූර්ව-සකසන ලද මූල්‍ය ක්‍රමෝපායන් සහ යාන්ත්‍රණ |

| | | |
|---|---|---|
| දේශගුණික විපර්යාස | - | ප්‍රධාන වශයෙන් මානව ක්‍රියාකාරකම් සහ හරිතාගාර වායු විමෝචනය සහ ෆොසිල ඉන්ධන දහනය නිසා ඇති වන සමස්ත ගෝලීය උෂ්ණත්වය ඉහළ යාම හේතුවෙන් ඇති වන උෂ්ණත්ව හා කාලගුණික රටා වල දිගුකාලීන වෙනස්වීම් මෙම ක්‍රියාවලියට දායක වන ප්‍රධාන අංශ වන්නේ බලශක්තිය, කර්මාන්ත, ප්‍රවාහනය, ගොඩනැගිලි, කෘෂිකර්මය සහ ඉඩම් පරිහරණයයි |
| දේශගුණික විපර්යාස අනුවර්තනය | CCA | දැනට සිදුවන හෝ අපේක්ෂිත දේශගුණික විපර්යාසවලට ප්‍රතිචාර දැක්වීම සඳහා ස්වභාවික හෝ මානව සංසිද්ධි ගලපා ගැනීම සහ සෘණාත්මක බලපෑම් අවම කිරීමට හෝ ධනාත්මක අවස්ථා ප්‍රයෝජනයට ගැනීමට අනුවර්තනය වීම |
| දේශගුණික විපර්යාස අවම කිරීම | - | හරිතාගාර වායු විමෝචන ප්‍රභවයන් අඩු කිරීමට හෝ වායුගෝලයෙන් හරිතාගාර වායු ඉවත් කරන සින්ක් වර්ග වැඩි දියුණු කිරීම පිණිස මානව මැදිහත්වීම |
| දේශගුණික අවදානම | - | ආපදාවකට (ගංවතුර, නියඟ හෝ කුණාටුව වැනි), නිරාවරණය (මිනිසුන්, වත්කම් හෝ යටිතල පහසුකම්) වීමෙන් හානි ඇති වීමේ අවදානම. දේශගුණික අවදානම් කළමනාකරණය හරහා මෙම අවදානම් අවම කර ගත හැකිය. |
| දේශගුණික අවදානම් කළමනාකරණය | CRM | අවදානම් පිළිබඳ දැනුම්වත් කිරීම් සහ අවදානම් තක්සේරු කිරීම්, අවදානම් වැළැක්වීම, අවදානම් අඩු කිරීම, අවදානම් වෙනස් කිරීම සහ අවදානම් මග හැරීම ඇතුළු විවිධ විශය පරාසයකි. |
| ප්‍රජාව | - | ප්‍රදේශයක එකට ජීවත් වන විවිධ ජීවීන් සමූහයකි |
| බහු පාර්ශවීය සමුලුව (Conference of the Parties) | COP | UNFCCC හි උත්තරීතර ආයතනය සහ දැනට වසරකට වරක් රැස්වී දේශගුණික විපර්යාස අවම කිරීම, අනුවර්තනය වීම සහ දේශගුණික ක්‍රියාකාරකම්වල අනෙකුත් අංශවල ප්‍රගතිය සමාලෝචනය කරයි COP හි වාර්ෂික රැස්වීම් බොහෝ විට COP ලෙසද හැඳින්වේ |
| සංරක්ෂණය | - | පාරිසරික දැනුම සහ මූලධර්ම භාවිතයෙන් පරිසරය අනවශ්‍ය වෙනස්කම් වලින් ආරක්ෂා කිරීමේ ක්‍රියාවලිය සහ පාරිසරික ගුණාත්මකභාවය සහ සම්පත් නඩත්තු කිරීම |

| | | |
|---|---|---|
| ඝනත්වය | - | නිශ්චිත ප්‍රදේශයක වෙසෙන පුද්ගලයන් (ජීවීන්, විශේෂ) සංඛ්‍යාව |
| පරිසර පද්ධතිය | - | ශාක, සත්ව සහ ක්ෂුද්‍ර ජීවීන් ප්‍රජාවන් සහිත සංකීර්ණයක් සහ ඔවුන් ජීවත් වන පරිසරය සමඟ ඔවුන්ගේ අන්තර්ක්‍රියා |
| පරිසරය | - | භෞතික ලෝකය සහ අනෙකුත් ජීවීන් ඇතුළු ඕනෑම ජීවියෙකුගේ වටපිටාව |
| මිහිතලය රත්වීම | - | මානව ක්‍රියාකාරකම් හේතුවෙන් පූර්ව කාර්මික යුගයේ සිට (1850 සහ 1900 අතර) නිරීක්ෂණය කරන ලද පෘථිවි පෘෂ්ඨයේ දිගුකාලීන උණුසුම් විය ප්‍රධාන වශයෙන් සිදුවන්නේ පොසිල ඉන්ධන දහනය වීම නිසා වන අතර එමඟින් පෘථිවි වායුගෝලයේ තාපය උරාගන්නා හරිතාගාර වායූන් වැඩි වන අතර දිගු කාලීන දේශගුණික විපර්යාස සහ වෙනස්වීම්වලට මග පාදයි |
| හරිතාගාර වායු විමෝචනය | GHGs | ප්‍රධාන GHGs කාබන් ඩයොක්සයිඩ් (CO2), මීතේන් (CH4) සහ නයිට්‍රස් ඔක්සයිඩ් (N2O) මෙන්ම අඩු ප්‍රචලිත GHGs හයිඩ්‍රොෆ්ලෝරොකාබන් (HFCs), ප්‍රෆෝලෝරොකාබන් (PFCs) ඇතුළුව ගෝලීය උණුසුම සහ දේශගුණික විපර්යාස ඇති කිරීමට වගකිව යුතු වායුගෝලීය වායූන් සහ සල්ෆර් හෙක්සැෆ්ලෝරයිඩ් (SF6) මුදාහැරීම් |
| දේශගුණික විපර්යාස පිළිබඳ අන්තර් රාජ්‍ය කමිටුව | IPCC | පාරිසරක ක්ෂේත්‍රය පිළිබඳ ගෝලීය විද්‍යාත්මක හා තාක්ෂණික පර්යේෂණවල තත්ත්වය සමීක්ෂණය කරන සහ විද්‍යාඥයින් සිය ගණනක් විසින් සමාලෝචනය කරන ලද නිතිපතා තක්සේරු වාර්තා ප්‍රකාශයට පත් කරන ලෝකයේ දේශගුණික විපර්යාස පිළිබඳ ප්‍රමුඛතම විද්‍යාත්මක ආයතනය |
| කියෝතෝ ප්‍රඥප්තිය | - | ඔහතක්ක යටතේ ඇති ජාත්‍යන්තර ගිවිසුම් දෙකෙන් එකකි ප්‍රඥප්තියේ අඩංගු බොහෝ දේ තිබුණත්, කාර්මික රටවල් විසින් GHG විමෝචනය අඩු කිරීම සඳහා ඉලක්ක තබා ගැනීමට මේ හරහා බැඳී ඇත. |
| බිංදුවට අඩු කිරීම (Net zero) | - | දැනට සුලු පරිමාණයෙන් පමණක් ක්‍රියාත්මක වන ස්වභාවික සින්ක් හෝ තාක්ෂණික ක්‍රම හරහා කාබන් ඉවත් කිරීමේ ක්‍රියාමාර්ග හරහා, නිශ්චිත කාල සීමාවක් තුළ මිනිසා විසින් නිර්මාණය කරන ලද ඨ්‍යඨ වායු ඉවත් කිරීම් සමඟ මානව ප්‍රේරිත හරිතාගාර වායු විමෝචනය සමතුලිත කිරීම |

| | | |
|---|---|---|
| පැරිස් සම්මුතිය | PA | UNFCCC යටතේ ඇති ජාත්‍යන්තර ගිවිසුම් දෙකෙන් එකකි පැරිස් ගිවිසුමේ කේන්ද්‍රීය ඉලක්කය වන්නේ ගෝලීය උෂ්ණත්වය ඉහළ යාම පූර්ව කාර්මික මට්ටමට වඩා සෙල්සියස් අංශක 2 ට වඩා අඩුවෙන් සීමා කිරීමයි. වඩාත් සුදුසු සෙල්සියස් අංශක 1.5 දක්වා සීමා කිරීමයී |
| ශාක ආරක්ෂණය | - | ජෛව පාලන වගා ක්‍රමවලින් සහ විශේෂයෙන් පළිබෝධනාශක යෙදීම හරහා රෝග වලින් ශාක ආරක්ෂා කිරීමේ ක්‍රම |
| ජනගහනය | - | නිශ්චිත ප්‍රදේශයක ජීවත් වන සහ අන්තර් අභිජනනය කළ හැකි එකම විශේෂයකට අයත් ජීවීන් ගණන |
| සංරක්ෂණය | - | පරිසරය සහ එහි අනුඅංග අනවශ්‍ය හානිවලින් හෝ විනාශ වී යාමෙන් ආරක්ෂා කිරීමේ ක්‍රියාවලිය |
| ආරක්ෂණය | - | වඳවීමේ තර්ජනයට ලක්ව ඇති බවට නීත්‍යානුකූලව හඳුනාගෙන ඇති ජීවී විශේෂයක් හෝ ජෛව විවිධත්වය සහ ස්වාභාවික සම්පත් නඩත්තු කිරීම සඳහා විශේෂ වටිනාකමක් ඇති මුහුදේ හෝ ගොඩබිම් ප්‍රදේශයක් ආරක්ෂා කිරීමේ ක්‍රියාවලිය |
| පුනර්ජනනය | - | එළි පෙහෙළි කරන ලද හෝ පුළුස්සා දැමූ භූමියේ නැවත වැඩෙන වෘක්ෂලතා ක්‍රියාවලිය |
| ජීවීන් විශේෂ | - | අන්තර් අභිජනනය කළ හැකි ජීවීන් සමූහයකි විශේෂයක් යනු ජානමය බෙදීමකි |
| දේශගුණික විපර්යාස පිළිබඳ එක්සත් ජාතීන්ගේ සම්මුතිය | UNFCCC | 1992 දී එක්සත් ජාතීන්ගේ පරිසරය හා සංවර්ධනය පිළිබඳ සමුළුව (UNCED) ("රියෝ පෘථිවි සමුළුව") හිදී පිහිටුවන ලද ජාත්‍යන්තර ගිවිසුමකී දේශගුණික පද්ධතියට "භයානක" මානව මැදිහත්වීම් වැළැක්වීම සඳහා 1994 මාර්තු 21 දින බලාත්මක වියී |
| තිරසාර සංවර්ධනය | | අනාගත පරපුරට තම අවශ්‍යතා සපුරා ගැනීමට ඇති හැකියාවට හානියක් නොවන පරිදි වර්තමාන අවශ්‍යතා සපුරාලන සංවර්ධනය |

## ආශ්‍රිත ග්‍රන්ථ

Kille, L. W. (2009). ***Committee of Concerned Journalists: The principles of journalism.*** The Journalist's Resource. Retrieved May 8, 2023, from https://journalistsresource.org/home/principles-of-journalism/

Northern Michigan University Writing Center. (n.d.). ***Introduction to Journalism | NMU Writing Center.*** Northern Michigan University. Retrieved April 8, 2023, from https://nmu.edu/writingcenter/journalism-introduction

Poulson, D. (2018, October 18). ***Challenges of covering the environment - Knight Center for Environmental Journalism.*** Knight Center for Environmental Journalism. Retrieved May 8, 2023, from https://knightcenter.jrn.msu.edu/2018/10/18/challenges-of-covering-the-environment/

Shalika, B. (2016). Analysis on Environmental Journalism and the Challenges of Journalists in Sri Lanka. ***Analysis on Environmental Journalism and the Challenges of Journalists in Sri Lanka,*** 9(2), 88-92. https://www.indianjournals.com/ijor.aspx?target=ijor:jgc&volume=9&issue=2&article=004

United Nations Environment Programme. (n.d.). ***Publications & data.*** UNEP. Retrieved May 14, 2023, from https://www.unep.org/publications-data

United Nations Framework Convention on Climate Change. (n.d.). ***Resources.*** UNFCCC. Retrieved May 14, 2023, from https://unfccc.int/resources

Xu, J., & Han, R. (2019). The Influence of Place Attachment on Pro-Environmental Behaviors: The Moderating Effect of Social Media. ***International Journal of Environmental Research and Public Health, 16.*** https://www.ncbi.nlm.nih.gov/pmc/articles/PMC6950263/#:~:text=Many%20studies%20have%20shown%20that,people's%20perception%20of%20environmental%20risks.

**ශ්‍රී ලංකා පුවත්පත් ආයතනය (SLPI)**
96, කිරුළ පාර, කොළඹ 05.
P +94 (0)11 5 353 635 | F +94 (0)11 5 335 500
info@slpi.lk | www.slpi.lk